## ශ්‍රී ලාංකීය පාසල් 21 වන සියවසේ අධ්‍යාපනය වෙත ගෙන යාම අරමුණු කර ක්‍රියාවට නඟන මානව සම්පත් සංවර්ධන වැඩසටහන

## Human Resource Development Programme to take Sri Lankan Schools to 21st Century Education

**සැසිය 11 (Session 11)**

**පුනරීක්ෂණය හා පාසල් අධ්‍යාපනය සඳහා විදේශ රටවල් යොදා ගෙන තිබෙන ප්‍රමිති පාදක විෂයමාලා**

**පුනරීක්ෂණය:**

1. පහත දක්වා ඇති වගන්ති හතර ඔබ හඳුන්වා දෙන්නේ කෙසේ ද?
   (i) නිසි නියාමනයක් (Monitoring) යටතේ පාසල් විෂයමාලා සාර්ථක ව **ක්‍රියාත්මක කරයි**.
   (ii) ගුණාත්මක ඉගෙනුමක් සඳහා අත්‍යවශ්‍ය **ශික්ෂණවිද්‍යාත්මක ප්‍රවේශ** (Pedagogical Approaches) යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියවලිය මෙහෙයවීම සඳහා **ගුරුවරුන් යොමු කරයි**.
   (iii) සිසු ඉගෙනුම් පල සාක්ෂාත් වීම තහවුරු කිරීම සඳහා තක්සේරු හා ඇගයීම් ක්‍රමපිළිවෙත් **ක්‍රියාවට නංවයි**.
   (iv) ඉගෙනුම්-ඉගැන්වීම්-තක්සේරු-ඇගයීම් ක්‍රියාවලිය මැනවින් හැසිරවීම සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවස්ථා ගුරුවරුන්ට **ලබා දෙයි**.

- ඉහත සඳහන් වගන්ති **විෂයමාලා නායකයෙකු (Curriculum Leader)** සංවර්ධනය කර ගත යුතු **හැකියා** හතරක් ඉදිරිපත් කරන බව
- පාසල් විදුහල්පතිවරුන් වඩවා ගත යුතු මෙම හැකියා **විදුහල්පති නිපුණතා** (Competencies to be developed by School Principals) ලෙස හඳුන්වන බව
- නිපුණතාවක සංරචක ලෙස සැළකෙන දැනුම් (Knowledge), ආකල්ප (Attitudes) හා කුසලතා (Skills) ඒකාරාශී වීමෙන් මෙම නිපුණතා ගොඩනැඟී තිබෙන බව
- මෙවන් නිපුණතා (Competencies) වඩවා ගන්නා විදුහල්පතිවරුන් 21 වන සියවසේ අධ්‍යාපනය වෙත ශ්‍රී ලාංකීය පාසල් ගෙන යාම සඳහා සූදානම් බව

2. මූලික හා උසස් විදුහල්පතිත්ව පාඨමාලා නිපුණතා වසම්, නිපුණතා ක්ෂේත්‍ර, නිපුණතා ප්‍රමිති හා වයර්ාත්මක / භෞතික දශර්ක ඔස්සේ සංවර්ධනය වී ඇති ආකාරය පෙන්වා දෙන්නේ කෙසේ ද?

   **නිපුණතා වසම 4**
   ගුණාත්මක ඉගෙනුම් පල
   **නිපුණතා ක්ෂේත්‍රය 4.2**
   ඉගෙනුම හා ඉගැන්වීම
   **ප්‍රමිතිය 4.2.1**
   ගුණාත්මක ශික්ෂණවිද්‍යාවකට (Pedagogy) ඉඩ සලසන **සඵලදායි වාතාවරණ** පාසල පුරා ගොඩනැඟී තිබේ.
   **ප්‍රමිතිය 4.2.2**

සඵලදායි ඉගෙනුම්-ඉගැන්වීම් සැලසුම් ඔස්සේ සඵලදායි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම සඳහා **ගුරුවරුන්ගේ සූදානම** නිතිපතා නියාමනයට ලක් වෙයි.

**ප්‍රමිතිය 4.2.2 සාක්ෂාත් කර ගන්නා මට්ටම් හඳුනා ගැනීම සඳහා තීරණය කර තිබෙන චයර්ාත්මක හා භෞතික දශර්ක**

(අ) ලබා දී ඇති ආකෘති ප්‍රකාර ව වාෂර්ික වැඩසැලසුම්, **වාර සටහන් / ඒකක සැලසුම්** හා ක්‍රියාකාරකම් සැලසුම් ගුරුවරුන් සකස් කර ඇත.

(ආ)තකර්ානුකූල පදනමක් යටතේ විෂය අන්තගර්තය හඳුනාගනිමින්, අනුපිළිවෙල කිරීමට ගුරුවරුන් යොමු ව ඇත.

(ඇ)දේශීය පසුබිමට, ප්‍රාදේශීය පසුබිමට (local & regional context), පරිසරයට (Environment) මෙන් ම ශිෂ්‍ය අද්දැකීම්වලට ගැලපෙන ආකාරයට විෂය අන්තගර්තය සිසුන්ට පවරා දීම සඳහා ගුරුවරුන් සූදානම් ය.

(ඈ)ක්‍රියාකාරකම් සැලසුම් ආශ්‍රිත අරමුණු තහවුරු කිරීමට, ගුරුවරුන් සිසුන්ට ලබා දෙන <u>ගෙදර වැඩ පැවරුම්</u> සමත් ය.

2007 විෂයමාලා ප්‍රතිසංස්කරණය හඳුන්වා දී තිබෙන කාරණාවලට අදාළ අතිරේක <u>භෞතික දශර්කයක්</u>

ක්‍රියාවෙන් ඉගෙනුම සිසුන්ට පහසු කරන සැහැල්ලු ලී බඩු (light furniture), සුහුරු පුවරු (smart board වැනි <u>උපාංග</u> මෙන් ම ජංගම විද්‍යාගාර (mobile laboratories), ජංගම පුස්තකාල (mobile libraries) වැනි <u>කාාර්ය පරිශ්‍ර</u> පන්තිකාමරය තුළ දක්නට ඇත.

**ප්‍රමිතිය 4.2.3**

සියලු ම පන්තිකාමරවල ශිෂ්‍ය කේන්ද්‍රීය ශික්ෂණ විද්‍යාව ක්‍රියාත්මක වෙයි.

**චයර්ාත්මක හා භෞතික දශර්ක**

(i) සිසු කියවීම දිරි ගැන්වෙන **වැඩසටහන්** පාසල සතුව ඇත.

(ii) සියලු ම ගුරුවරුන් කණ්ඩායම් ක්‍රියාකාරකම් ඔස්සේ සිදු වන සිසු ඉගෙනුම **අවධාරණය කරයි.**

(iii) තම කණ්ඩායම, වෙනත් කණ්ඩායම්, ගුරුවරයා, බාහිර ප්‍රජාව (සමීප හා දුරස්ථ) වැනි **විවිධ මූලාශ්‍රවලින් ඉගෙනීමේ අවස්ථා** සිසුන්ට ඇත.

(iv) සිසු කාායර්වල සම්පූණර් බව හා නිරවද්‍යතාව තහවුරු කිරීම සඳහා සියලු ම ගුරුවරුන් **සිසු වැඩ පරීක්ෂා කරයි.**

**ප්‍රමිතිය 4.2.4**

ළමුන් පිළිබඳ සොයා බලමින් ළමුන්ට සහාය වන, ශක්තිමත් ගුරු සිසු සබඳතා සියලු ම පන්තිකාමරවල දක්නට ලැබේ.

3. දශර්ක සාථර්ක වූ මට්ටම් සොයා බැලීම සඳහා සකස් කළ හැකි පරිමාණ මොනවා ද?
   - **මධ්‍ය ලක්ෂ්‍යයක් සහිත ලක්ෂ්‍ය තුනේ / ලක්ෂ්‍ය පහේ පරිමාණ (Three /Five Point Scales)**
   - **මධ්‍ය ලක්ෂ්‍යයක් රහිත ලක්ෂ්‍ය දෙකේ / හතරේ (Four Point Scales) / හයේ පරිමාණ**

4. ඉහත සඳහන් ලක්ෂ්‍ය තුනේ පරිමාණ ඔබ හඳුන්වා දෙන්නේ කෙසේ ද?

   ප්‍රදශර්නය නොවේ (Not Evident - NE), සංවධර්නය අරඹා ඇත (Developing - D), සාථර්ක ව ප්‍රදශර්නය වේ (Evident - E) යන මට්ටම් හඳුනාගත හැකි ආකාරයට සකස් කර තිබීම
   - **NE** - ප්‍රමිතිය සාක්ෂාත් වන බව නොපෙනෙයි.

- **D** - ප්‍රමිතිය සාක්ෂාත් වීම අරඹා ඇති බව පෙනෙයි.
- **E** - ප්‍රමිතිය සාක්ෂාත් වී ඇති බව පෙනෙයි.

5. ලක්ෂ්‍ය තුනක්/පහක් සහිත පරිමාණවල ගුණ අගුණ ඔබ පෙන්වා දෙන්නේ කෙසේ ද?
   - මධ්‍ය ලක්ෂ්‍යයක් සහිත පරිමාණ ය.
   - පැහැදිලි විනිශ්චයක් ලබා දීමෙන් වැළකී සිටීමේ හැකියාව ලකුණු ලබා දෙන්නා සතු වීම මෙහි දුවර්ලතාව වෙයි.
6. වඩා ඵලදායි චතුර් ලක්ෂ්‍ය පරිමාණ (Four Point Scales) ඒවායේ ගුණ සමග ඔබ හඳුන්වා දෙන්නේ කෙසේ ද?
   - ලක්ෂ්‍ය සංඛ්‍යාව අනවශ්‍ය තරමට අඩු වී හෝ වැඩි වී නැත.
   - විවිධාකාර වූ දර්ශක යොදා ගනිමින් සකස් කළ හැකි ය.
     - **අපේක්ෂිත ලක්ෂණ** ප්‍රදශර්නය නොවේ / ප්‍රදශර්නය වීම අරඹා ඇත / ප්‍රදශර්නය වැඩිදියුණුවෙමින් පවති /සාර්ථක ව ප්‍රදශර්නය වෙයි.
     - ආරම්භක / සංවධර්නය වන / ඉහළ මට්ටමකට සංවධර්නය වූ / විශිෂ්ටත්වයට සපැමිණි
   - මධ්‍ය ලක්ෂ්‍යයක් නොමැති මෙවන් පරිමාණ හමුවේ වැට **උඩ සිටීමේ හැකියාව** ලකුණ ලබා දෙන්නාට නොලැබීම මෙහි වාසිය වෙයි.
7. මේ වන විට ඔබ හඳුනාගෙන තිබෙන, ශ්‍රී ලාංකිය පාසල්වල ක්‍රියාත්මක වන ප්‍රමිති පාදක වැඩසටහන් මොනවා ද?
   - පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව පිළිබඳ වැඩසටහන (Programme for School Quality Assurance)
   - විදුහල්පතිවරුන් සංවධර්නය සඳහා සකස් කර තිබෙන මූලික හා උසස් විදුහල්පතිත්ව වැඩසටහන් (Basic and Advanced Principalship Programmes)
8. විෂයමාලා සැලසුම්කරණයේ (Curriculum Planning) හා විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ (Curriculum Implementation) සාර්ථකත්වය සඳහා තවදුරටත් ඔබ හඳුනාගත යුතු ප්‍රමිති පාදක වැඩසටහන් මොනවා ද?

   සිසු ඉගෙනුම ප්‍රවධර්නය සඳහා වෙනත් රටවල ජනප්‍රිය වී තිබෙන **ප්‍රමිති පාදක පාසල් විෂයමාලා** (Standards-Based School Curricula - SBSC)

<u>**පාසල් අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා විදේශ රටවල් යොදා ගෙන තිබෙන ප්‍රමිති පාදක විෂයමාලා**</u>

1. ප්‍රමිති පාදක විෂයමාලාවක ව්‍යුහය තීරණය කරන **සංරචක පහ** නිදසුන් ඇසුරින් හඳුන්වා දෙන්නේ කෙසේ ද?

   **(අ) ප්‍රමිතිය (Standards)** - අපේක්ෂිත ඉගෙනුම පිළිබඳ ව ඉදිරිපත් කරනු ලබන පුළුල් ප්‍රකාශය

   උදා: **ලේඛනය** යොදා ගනිමින් සිසුන් ඵලදායි **සන්නිවේදනයක** නිරත වෙයි.

   **සන්නිවේදනය (Communication)** යනුවෙන් ඔබ තේරුම් ගෙන ඇත්තේ කුමක් ද?
   - **පණිවිඩ ලබා ගැනීම** - සවන් දීමෙන් හා කියවීමෙන් (Listening and Reading)
   - **පණිවිඩ ලබා දීම** - කථනයෙන් හා ලේඛනයෙන් (Speaking and Writing)

**(ආ)** **නිණර්ායක (Criteria)** - ප්‍රමිතියක මූලික මාන (dimensions), පැති (facets) හෝ සංරචක (components)

Vocabulary (පද සම්භාරය) / Spelling (අක්ෂර වින්‍යාස) / ව්‍යාකරණ Grammar උදා: ව්‍යාකරණ නිවැරදි ව භාවිත කරයි.

**(ඇ)** **දශර්ක** / සම්මත මට්ටම් (**Indicators**/Benchmarks) - ප්‍රමිතිය සාක්ෂාත් ව ඇති බව පෙන්වා දෙන නිරීක්ෂණය කළ හැකි හා මිනුමට ලක් කළ හැකි සාක්ෂි

අතීත/වතර්මාන/අනාගත කාල / උක්ත-ආඛ්‍යාත සම්බන්ධතා / විරාමපද නිවැරදි ව භාවිත කරයි.

**(ඈ)** **ඉගෙනුම් අද්දැකීම්** (Learning Experiences) - ප්‍රමිතිය සාක්ෂාත් කර ගැනීම සඳහා සිසුන්ට උදව් කරන ක්‍රියාකාරකම්

දශර්ක යටතේ සඳහන් කරන ලද කාරණා සාක්ෂාත් කළ හැකි ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**(ඉ)** **ඇගයීම** (Evaluation) සිසුන් ප්‍රමිතිය සාක්ෂාත් කළේ ද යන්න තීරණය කරන ක්‍රම

රචනාවක් / ඡේදයක් ලිවීමට හෝ ලිඛිත පරීක්ෂණයකට පිළිතුරු සැපයීමට ඉඩ සලසයි.

2. ප්‍රමිති පාදක විෂයමාලාවක් යනු ඒ ඒ ශ්‍රේණිවල ඉගෙනගන්නා සිසුන් **දැන ගත යුත්තේ** මොනවා ද? ඔවුන්ට **කළ හැකි විය යුත්තේ** මොනවා ද? යන කාරණා පැහැදිලි ව නිවර්චනය කෙරෙන **ඉගෙනුම් ප්‍රමිති** මත සංවිධානය වූවකි. මේ ප්‍රමිති සාක්ෂාත් වීම මිනුමට ලක් කළ හැකි නිණර්ායක හා දශර්ක ගොඩනැඟීම ඊළඟට සිදු වන අතර **විෂයමාලා සම්පාදකයින්ගේ අවධානය යොමු විය යුතු** ඉගෙනුම්-ඉගැන්වීම්, තක්සේරු හා ඇගයීම් ක්‍රමපිළිවෙත් පිළිබඳ තීරණ ගැනීම ද ඒ සමග ම සිදු වෙයි.

   - ඉහත ඡේදය පෙන්වා දෙන ආකාරයට **ප්‍රමිති පාදක හා නිපුණතා පාදක විෂයමාලා** අතර පවතින ප්‍රධාන වෙනස කුමක් ද?
     2007 වෂර්යේ දී ශ්‍රී ලාංකීය පාසල් අධ්‍යාපනයට සපැමිණි **නිපුණතා පාදක විෂයමාලා** සිසුන් **දැන ගත යුත්තේ** මොනවා ද? යන කාරණය අවධාරණය නොකරයි. ඉන් ඔබ්බට යමින් සිසුන්ට **කළ හැකි විය යුත්තේ** මොනවා ද? යන කාරණාව කෙරෙහි සුවිශේෂී අවධානය යොමු කරයි.

3. විෂයමාලාවක මූලික කොටස් තුනෙන් එකක් වන විෂය නිදෙර්ශයට (Syllabus) ඇතුළත් සංරචක මොනවා ද? එම සංරචක භාවිතයට ගන්නේ කෙසේ ද?
   - පුළුල් ඉගෙනුම් පල, මධ්‍ය කාලීන ඉගෙනුම් පල, විෂය අන්තගර්තය හා කාලය
   - ක්‍රියාකාරකම් සැලසුම්කරණයේ දී

4. ක්‍රියාකාරකමක අවසානයේ දී ඉදිරිපත් වන කෙටිකාලීන ඉගෙනුම් පලවල විශේෂත්වය කුමක් ද? එම ඉගෙනුම් පල භාවිතයට ගන්නේ කෙසේ ද?
   - ක්‍රියාකාරකමට ඇතුළත් කර තිබෙන විෂය අන්තගර්තය හා ක්‍රියාකාරකම මෙහෙයවන ආකාරය මත තීරණය වන්නක්
   - සිසු සාක්ෂාත්කරණ සොයා බලන තක්සේරුවේ දී හා ඇගයීමේ දී

5. පාසල් අධ්‍යාපනය සඳහා ප්‍රමිති පාදක විෂයමාලා සම්පාදනය කළ හැකි ආකාරය නිදසුන් ඇසුරින් පෙන්වා දෙන්නේ කෙසේ ද?

   **උදාහරණය 1:**

   **ප්‍රමිතිය** : ලේඛනය යොදා ගනිමින් ඵලදායි සන්නිවේදනයක යෙදෙයි.

   **නිණර්ායක** : **ව්‍යාකරණ** නිවැරදි ව භාවිත කරයි.

**දශර්ක** **:** අතීත, වතර්මාන හා අනාගත කාල (tenses) නිවැරදි ව භාවිත කරමින් ද උක්ත-ආඛ්‍යාත සම්බන්ධතා (subject-verb agreement) හා විරාම ලකුණු (punctuation marks) නිවැරදි ව යොදා ගනිමින් ද වැකි ලියයි.

**ඉගෙනුම් අද්දැකීම්** : ප්‍රමිතිය සාක්ෂාත් කර ගැනීම සඳහා සිසුන් නිරත කරවීමට අපේක්ෂා කරන ඉගෙනුම් ක්‍රියාකාරකම

**ඇගයීම** : සිසු ඉගෙනුම ඇගයිමට ලක් කිරීම සඳහා ගොඩ නඟන තක්සේරු හා ඇගයීම් නිර්ණායක / ඉගෙනුම සඳහා ඇගයිම හා ඉගෙනුම පිළිබඳ ඇගයීම සඳහා ගොඩ නඟන නිර්ණායක

**මේ අනුව ප්‍රමිති පාදක විෂයමාලාවකට ඇතුළත් විය යුතු** මූලික සංරචක පහ

- පැහැදිලි ව නිවර්චනය කර තිබෙන ඉගෙනුම් **ප්‍රමිති,**
- ඒ ඒ ඉගෙනුම් ප්‍රමිතියේ විවිධ පැතිකඩ පෙන්වා දෙන **නිර්ණායක,**
- ඒ ඒ නිර්ණායකය සාක්ෂාත් වන මට්ටම හඳුනා ගැනීමට උදව් කරන **දශර්ක**
- දශර්ක, නිර්ණායක හා ප්‍රමිති සාක්ෂාත් කර ගැනීම සඳහා සකස් කරන ක්‍රියාකාරකම් හා
- සිසුන් සාක්ෂාත් කර ගන්නා ඉගෙනුම් මට්ටම් හඳුනා ගැනිම සඳහා යොදා ගන්නා ඇගයීම් ක්‍රම